ආයතනයේ නම: ආරක්ෂක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇඟුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்: பாதுகாப்பு அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டு நடவடிக்கைகளும் பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

Name of the Institution: Ministry of Defence

Submission of Observations of Hon. Minister and Steps Taken with Regard to the Reports Tabled by the Committee on Public Accounts in Terms of Standing Order No:119(4)

පටුන/பக்கம்/Contents

භාෂාව/மொழி/Language	පිටු අංකය/பக்க இலக்கம்/ Page Number
සිංහල/சிங்களம்/Sinhala	1-6
දෙමළ/தமிழ்/Tamil	7-13
ඉංග්‍රීසි/ஆங்கிலம்/English	14-18

<u>රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 117 මඟින් පෙන්වාදී ඇති දුර්වලතාවයන් සමථයකට පත්කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන තත්ත්වය.</u>

01. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

කමිටුව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා	දුර්වලතාවයන් සමථයකට පත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්ථමාන තත්ත්වය
01. ශ්‍රී ලංකා ගුවන් හමුදාපති සුභසාධක අරමුදලට නිළධාරීන් විසින් මූල්‍යමය දායකත්වය සැපයීම ආරම්භ කරන විට ඔවුන්ට ගෙවීමට පොරොන්දුවූ මුදලට වඩා අඩු මුදලක් සේවයෙන් ඉවත් වීමේදී ගෙවීම.	අ. ගුවන් හමුදාව විසින් 2019 වසරේ සැප්තැම්බර් මාසයේ සිට විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් විමර්ෂණය කිරීම සඳහා නැවත පත් කරන ලද කමිටු නිර්දේශයන්ට අනුව වර්තමානයේ විශ්‍රාම ප්‍රතිලාභ සියලු සේවා පුද්ගලයින්ට ගෙවනු ලබයි. එසේම නව විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අනුව 2017 වසරේ ජූලි මස සිට 2019 සැප්තැම්බර් මස දක්වා විශ්‍රාම ගිය සියලු සේවා පුද්ගලයින්ට හිඟ වූ විශ්‍රාම ප්‍රතිලාභයන් ගෙවා අවසන් කර ඇති අතර මෙම විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධව අධිකරණ ක්‍රියාවන් වල නියුතු සේවා පුද්ගලයින්ගේ ප්‍රතිලාභ එම කටයුතු අවසන් වූ පසු ගෙවීම් කිරීමට කටයුතු සලසා ඇත.
02. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් අළුත්වැඩියා සඳහා යවා ඇති රේඩාර් රිසිවරයක් (LRU 02) සහ ඇන්ටනා ස්කෑනරයක්(LRU 01) අස්ථාගත වීමෙන් සිදු වූ රු. මිලියන 74.46 ක අලාභය.	අ. රක්ෂණාවරනයක් ලබාගැනීමට කටයුතු නොකල නිළධාරියාගේ වැටුපෙන් රු 173,729.43 ක් අයකරගෙන ඇති අතර ඉතිරි රු 306,094.83 ක මුදල 2023 ජූලි මස වන විට සම්පූර්ණයෙන්ම අය කර ගනු ලැබේ. ආ. අලාභය ඉතිරි කොටස වූ රු 98,194,092.87 ක මුදල (දෙපාර්තමේන්තු ගාස්තු ඇතුලත්ව) භාණ්ඩය අලුත්වැඩියාව සඳහා විදේශගත කිරීමට කටයුතු කල Care Logistic පුද්ගලික සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදී ඇති අතර එම විමර්ශනය සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා ගැනීමට විමර්ශන උධෘත 2018 වර්ෂයේ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. වර්තමාන තත්වය මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ශ්‍රීලංගුහ/437/3/නීති/සංවි 2020 ජුනි මස 26 වන දින දරණ යොමුව මගින් කරුණු විමසීමක් සිදු කර ඇතත් මේ වනතුරු එයට ප්‍රතිචාරයක් ලබා දී නොමැත.

	ඇ. කෙයා ලොජිස්ටික් පුද්ගලික සමාගම (M/s Care Logistic (Pvt) Ltd) අසාදු ලේඛණගත කිරීම සඳහා කටයුතු සම්පාදනය කර ඇත
03. ශ්‍රී ලංකා හෙලිටුවර්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධව පවතින නීතිමය තත්වය.	අ. හෙලිටුවර්ස් සමාගමේ කොටස් අයිතිය මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීම සඳහා එහි සාංගමික ව්‍යවස්ථා පත්‍රය (Article of Association) සංශෝධනය කළ යුතු බව මහා භාණ්ඩාගාරයේ නීති උපදේශක උපදෙස් දෙන ලදී. ඒ අනුව 2019.11.09 වන දින සංශෝධිත Article of Association මහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී. ආ. දෙවන වරට සංශෝධනය කරන ලෙස උපදෙස් ලැබුණු අතර ඒ අනුව සංශෝධනය කර නැවත භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඇ. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යතුමා විසින් ලබා දුන් වාචික උපදෙස්වලට අනුව හෙලිටුවර්ස් සමාගම රජයට අනුබද්ධිත අභ්‍යන්තර සිවිල් ගුවන් සේවා සමාගමක් ලෙස ස්ථාපනය කිරීම සඳහා කැබිනට් පත්‍ර කෙටුම්පතක් 2020.02.20 දින ආරක්ෂක අමාත්‍යාංශයට යොමු කර ඇත. ඈ. ඒ අනුව 2020.03.13 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේදී හෙලිටුවර්ස් සමාගම රජයට අනුබද්ධිත අභ්‍යන්තර සිවිල් ගුවන් සේවා සමාගමක් ලෙස ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ සැලසුම් සහ අධීක්ෂණය කිරීමේ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග හෙලිටුවර්ස් සමාගමේ නිළධාරින්ගේ සාකච්ඡාවට අනුව හෙලිටුවර්ස් සමාගමට උචිත ව්‍යාපාරික ආකෘතියක් සකස් කර ව්‍යාපාර ව්‍යුහය ඇතුලත් වන පරිදි ව්‍යාපාර ආකෘතියක් 2020.06.08 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ සැලසුම් සහ අධීක්ෂණය කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි. එසේම එකී ව්‍යාපාරික ආකෘතියේ පිටපතක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙතද යොමු කරන ලදි. ඉ. ඒ අනුව, දෙවන වරට සංශෝධනය කරන ලද සාංගමික ව්‍යවස්ථා පත්‍රය (Article of Association) සම්බන්ධයෙන් සහ හෙලිටුවර්ස් සමාගමේ ව්‍යාපාර ආකෘතිය (Business Module) සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිර්දේශ බලාපොරොත්තුවේ.

04. 2015 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් සපයන ලද ගුවන් ගමන් වෙනුවෙන් 2018.12.31 දින වන විට ගෙවිය යුතු රු. මිලියන 14.24ක හිග මුදල	ගුවන් ගමන් වෙනුවෙන් 2018.12.31 දිනට අයවිය යුතුව ඇති රු.මි 14.24 ක හිග මුදල අයකර ගැනීමේ ප්‍රගතිය පරිශිෂ්ය 1 ලෙස දක්වා ඇත.
05. ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකයේ ක්‍රියාකාරිත්වය, කාලීන අවශ්‍යතාවයන්ට සකස් කිරීම සහ එම ඒකකය කොළඹ ප්‍රදේශයේ ස්ථානගත කිරීම.	අ. ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා හඳුනාගත් 'බෙකරියවත්ත' නැමති ඉඩමෙහි හිමිකාරීත්වය දරනු ලබන නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රතිරක්ෂණ සංස්ථාව විසින් මෙම ඉඩම ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත නිදහස් කිරීමට එකඟතාවය ඵල නොකිරීම හේතුවෙන් ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා වෙනත් ස්ථානයක් තෝරා ගැනීමට සිදුවිය. ඒ අනුව, ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා බෙස් ලයින් මාවත, දෙමටගොඩ පිහිටි 'මස් මඩුව වත්ත' නැමති ඉඩමෙන් අක්කර 2ක ප්‍රමාණයක් ගුවන් හමුදාව වෙත පවරා ගැනීමට අදාල මූලික යෝජනාව ශ්‍රීලංගුහ/477/2/සංවිධාන මගින් 2020 ජුනි මස 09 වන දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. ආ. 2020 ජූලි මස 03 වන දින ඉඩම් ගැටලු කඩිනමින් විසඳීම පිණිස ආරක්ෂක අමාත්‍යාංශයේ පවත්වනු ලැබූ සාකච්ඡාවේදී ගුවන් හමුදා ගිනි නිවීම් ඒකකය ස්ථාපිත කිරීම සඳහා ඉඩමක් ලබා දීම පිළිබඳව පහත සඳහන් කරුණු සාකච්ඡා කරන ලදී. (1) මින් ඉහතදී ගුවන් හමුදා ගිනි නිවීම් ඒකකය ස්ථාපිත කර තිබූ ඩී ආර් විජේවර්ධන මාවතේ පිහිටි බේරේ වැව ආසන්නයේ ඇති ඉඩම ගුවන් හමුදාව වෙත ලබා දීමට ඇති හැකියාව පිළිබඳව කරුණු සොයා බලන ලෙස උපදෙස් දෙන ලදී. (2) ඉහත සඳහන් ඩී ආර් විජේවර්ධන මාවතේ පිහිටි බේරේ වැව ආසන්න ඉඩම ලබා ගැනීමට නොහැකි වුවහොත් කිරිමන්ඩල පාර නාරහෙන්පිට පිහිටි නයින් වෙල්ස් (Nine wells) රෝහලට යාබදව

	පිහිටා ඇති ඉඩමෙන් අක්කර 01 ඉඩම් ප්‍රමාණයක් ලබා දීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලන ලෙස උපදෙස් දෙන ලදී.
06. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ MI-17 හෙලිකොප්ටර් එන්ජින් 5ක් කටුනායක ගුවන් තොටුපළේ සිට රුසියාව දක්වා ප්‍රවාහනය කිරීම සඳහා 2017/04/17 දින මිල ගණන් කැඳවා තිබූ අතර පෞද්ගලික සමාගමක් වෙත ලන්සුව පිරිනමා තිබුණි.මෙම ආයතනයෙන් අදාළ සේවාවන් සපයා ගැනීම සඳහා රු.මිලියන 1.66ක මුදලට අමතරව ලන්සු කැඳවීමේ ලේඛනවල අතිරේක මිල වැඩි කිරීම සඳහා වූ ඉල්ලීම් පිළිනොගන්නා බව පැහැදිලිව දක්වා තිබියදී රු. මිලියන 1.15ක අමතර මුදලක් ගෙවා තිබීම.	අ. විගණන පරීක්ෂාවේදි පෙන්වා දී ඇති පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 6:3:6 ඡේදයට අනුකූලව පිළියෙල කර තිබූ ලංසු විවෘත කිරීමේ සටහන් (Bid Opening Minute) අත්සන් තබා ඇත්තේ ඒම ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටි M/s Wigyansa Globle (Pvt) Ltd යන සැපයුම් කරුගේ නියෝජිතයකු පමණි. නමුත් M/s Wigyansa Globle (Pvt) Ltd යන ආයතනයට අමතරව M/s Kingslog Supply Solution (Pvt) Ltd යන ආයතනයද එම ටෙන්ඩරය සඳහා ලංසු ඉදිරිපත් කර තිබූ අතර එම සැපයුම්කරුගේ නියෝජිතයකු අත්සන් නොකර එම ටෙන්ඩරය සඳහා ලංසු විවෘත කිරීමේ අවස්ථාවේ ලංසු ඉදිරිපත් කර නොමැති බව මෙයින් නිගමනය කල නොහැක. ආ. පහත සඳහන් ඇණවුම් අංක 05 සඳහාම අඩුම ලංසුව ඉදිරිපත් කර ඇත්තේ M/S Kingslog Supply Solution (Pvt) Ltd වන අතර එම සැපයුම්කරුට ලංසු ප්‍රදානය සඳහා 2017 මැයි 16 දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමිවිය. (1) AHQ/17/LS/BRK1021(PD/L/BRK/17/10263) (2) AHQ/17/LS/BRK1027(PD/L/BRK/17/10264) (3) AHQ/17/LS/BRK1025(PD/L/BRK/17/10266) (4) AHQ/17/LS/BRK1022(PD/L/BRK/17/10267) (5) AHQ/17/LS/BRK1026(PD/L/BRK/17/10268) ඇ. ඉහත දක්වා ඇති කරුණු සැලකිල්ලට ගැනීමේදී මෙම ගුවන් යානා එන්ජින් යැවිය යුතු ස්ථානය වන SVX (Koltsovo Airport) වෙත ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය වන ගුවන් පහසුකම් නොමැති බව සැපයුම්කරු විසින් සඳහන් කර තිබූ අතර අලුත්වැඩියා සඳහා යැවිය යුතු කර්මාන්තශාලාවට ආසන්නම ස්ථානයක් වන DME (Domodedovo Intrenational Airport) වෙත භාණ්ඩ ප්‍රවාහනය කල හැකි බව සැපයුම්කරු විකල්ප විසඳුමක් ලෙස ඉදිරිපත් කරන ලදි. අලුත්වැඩියා කරන කර්මාන්ත ශාලාව වෙත ගොඩබිමින් ප්‍රවාහනය සඳහා අතිරේක ගාස්තු වශයෙන් එක් ගුවන් යානා එන්ජිමක් සඳහා රු 229,166.66 ක මුදලක් බැගින් ගුවන් යානා එන්ජින් 05 සඳහා

රු 1,145,833.00ක මුදලක් වැයවන බව දන්වා තිබුණු අතර එම ගුවන් ප්‍රවාහන පිරිවැය හා ගොඩබිම් ප්‍රවාහන පිරිවැය ඇතුලත්ව මුලු ප්‍රවාහන පිරිවැය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හිමිවිය.

ඈ. ඉහත කරුණු සලකා බැලීමේදි සැපයුම්කරු ඉදිරිපත්කල මුලු පිරිවැය (ගොඩබිම් ප්‍රවාහන පිරිවැය ඇතුලත්ව) ඊලග අවම ලංසුකරු හට ටෙන්ඩරය ලබාදුනහොත් 1,461,900.98 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවන නිසාවෙනුත් සහ මෙම ගුවන් යානා එන්ජින් ඉක්මනින් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ගුවන් හමුදාව තුල පවතින විශේෂ අවශ්‍යතාවය මත M/s Kingslog Supply Solution (Pvt) Ltd සැපයුම්කරු හට අදාල ටෙන්ඩරය පිරිනමන ලදි.

M/s Kingslog Solutions (Pvt) Ltd			**M/s Wigynsa Global (Pvt) Ltd**	
ආරම්භක මිල(රු.)	මිලෙහි වැඩිවීම	අවසාන මිල (රු)	ආරම්භක මිල(රු.)	මිල පරතරය(රු.)
329,500.00	229,166.66	558,666.66	850,562.13	291,895.47
328,500.00	229,166.66	557,666.66	848,946.58	291,279.92
335,000.00	229,166.66	564,166.66	856,216.57	292,049.91
337,500.00	229,166.66	566,666.66	861,063.00	294,396.34
327,500.00	229,166.66	556,666.66	848,946.00	292,279.34
1,658,000.00	**1,145,833.30**	**2,803,833.30**	**4,265,734.28**	**1,461,900.98**

ඉ. තවද, තාක්ෂණික ඇගයුම් කමිටුවට මේ සම්බන්ධයෙන් වාචික අවවාද කිරීම සඳහා අවශ්‍ය පියවරගෙන ඇත.

07. 2018.12.31 දිනට අයවීම් හිඟහිට තිබූ ශේෂවල එකතුව ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.මිලියන 17.96ක් විය.එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්වයක පැවතීම.	අ. රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ 2018 දෙසැම්බර් මස 31 දිනට සිවිල් අංශයේ හිගව පැවති රු. 17,963,767.98 ක ශේෂය 2020 ජුනි මස 30 දින වන විට රු. 12,471.353.59 දක්වා අඩු කර ඇත. ඉතිරි හිඟ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් අඛණ්ඩව කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ආ. තවද, රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ 2018 දෙසැම්බර් මස 31 දිනට සේවා අංශයට අදාළ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන රු 609,917.91 ක ණය ශේෂය 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකර ගෙන ඇත.
08. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට වෛද්‍යවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය	අ. වර්තමානයේදී පහත සඳහන් ආකාරයන් යටතේ වෛද්‍යවරුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට බඳවා ගැනීම සිදු කරනු ලබයි. අ. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් වෛද්‍ය උපාධිය ලබා ගත් උපාධිධාරීන්. ආ. දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාල මගින් වෛද්‍ය උපාධිය ලබාගත් උපාධිධාරීන්. ඇ. විදේශයන්හි වෛද්‍ය විද්‍යාල මගින් උපාධි ලබාගත් උපාධිධාරීන් (පූර්ව සිමාවාසික පුහුණුව).

දීපිකා බුද්ධදාස
ප්‍රධාන මූල්‍ය නිලධාරි - I
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.